

# හදවතක් නැති රටක හදවත් බද්ධයේ කතාව

**නවීන් උඩවෙල**



මේ ලෝප්‍රකට නැශනල් ජෝග්‍රෆික් මාධ්‍ය ආයතනය විසින් 1987 වසරේ ලොව විශිෂ්ටතම ඡායාරූපය ලෙස තෝරාගත් චායාරූපයයි.

මෙහි දැක්වෙන්නේ Dr. Zbigniew Religa නම් පෝලන්ත ජාතික ශල්‍යවෛද්‍යවරයා අපමණ බාධක මැද්දේ එරට ප්‍රථම හෘද බද්ධ කිරීමේ ශල්‍යකර්මය නිම කිරීමෙන් පසු රෝගියාගේ තත්වය පරීක්ශා කරමින් සිටිනා අයුරුයි.

පැය විසිතුනක් පුරා දිවුනු ශල්‍යකර්මයෙන් අනතුරුව විඩාවට පත් ඔහුගේ සහායක ශල්‍ය වෛද්‍යවරයා ශල්‍යාගාරය්ම මුල්ලක නිදන අයුරු රූපයේ පෙනේ.

සිදුවිය යුතු පරිද්දෙන්ම මේ අසමාන ජීවයකයාට පෝලන්ත ජනතාවගෙන් ලැබුනේ ඉමහත් හරසරයකි. ඔහු ඉමහත් ජනතා බුහුමානයට පාත්‍ර වූ අතර ඔහුගේ ශල්‍යකර්මය පෝලන්තයේ පසුකාලීන හෘද බද්ධ කිරීම්වලට පදනම දැමීය...

ඒ පෝලන්තයයි...

මේ ආකරයටම ලංකාවේද වෛද්‍යවරයකු තමන් උගත් දෙයින් රටට දෙයක් කරන්නට සිතා පිටරටකදී තමන්ට ඉපයිය හැකි මුදල මෙන් දහගුණයකටත් අඩු පඩියකට රැකියා-වක් ලබාගෙන ලංකාවට පැමිණියේය. ඔහු සහ ඔහුගේ සිහිනය ගැන විශ්-වාසය තැබූ අනිකුත් වෛද්‍යවරුන් හෘද බද්ධ කිරීමකට අවශ්‍ය උපකරණ තම පෞද්ගලික වියදමින් විවිධ රටවලින් ලංකාවට ගෙන ආහ. බියුරොක්‍රැටික කඩයිම් පැන කෙසේ හෝ එක් පුද්ගලයෙක්ගේ හදවත තවත් පුද්ගලයෙක්ට බද්ධ කිරීමට ඔවුහු අවසරයද ලබා ගත්හ.

අවසන ඔවුන් කෙසේ හෝ (බොහෙ-ව්විට ලොව අඩුම පහසුකම් යටතේ) ලංකාවේ පලමු හෘද බද්ධ කිරීම සිදු කලහ.

ප්‍රශ්නය ආවේ ඉන් පසුවය. මේ කාලකණ්නි දූපතේ සියල්ලෝම හෘද ශල්‍ය වෛද්‍යවරුන් බව ඒ වෛද්‍යවරයා නොදැන සිටින්නට ඇත.

දෙවන සැත්කම වන විට රෝගියාගේ නිර්වින්දන යෝග්‍යතාව නිර්ණය කලේ මාධ්‍ය මගින් උසිගන්වනු ලැබූ ආවේගශීලී මෝඩයෙක් වන (හැඟුම්බර වීම මෝඩයෙක් ලෙස එක එකාගේ පදයට නැටීමට සාධ-ාරණ හේතුවක් ලෙස මා දකින්නේ නැත) රෝගියාගේ පියා සහ මිනිසකුගේ ජීවිතය බිල්ලට දී දේශපාලන ලකුණු දමා ගැනීම අරමුණු කරගත් පරිගණක විද්‍යාව පිලිබඳ මහාචාර්යවරයෙකි.

දූපත් වාසීන්ගේ මානසික ඇරියස් හොඳින්ම දත් දූපතේ මාධ්‍යවේදීන් කලේ මොවුන් පුම්බමින් අර වෛද්‍යවරුන් යක්ශයන් ලෙස හංවඩු ගැසීමය.

ඉන්පසු භූමිකාවට අවතීර්ණ වන මේ අරුම පුදුම දූපතේ සෞඛ්‍ය ඇමතිවරයාගේ බලපෑම් මත කෙසේ හෝ දෙවන සැත්කමත් සිදුවේ. කෙසේ නමුත් පළමු රෝගියාට වඩා ගැටලු රැසකින් පීඩා විඳි දෙවන අසරණ රෝගියා ඉතා ඉහල මරණ අනුපාතයක් සහිත හෘද බද්ධ කිරීමේ ශල්‍යකර්මයෙන් සුවය නොලබාම මිය යයි.

මේ දූපත පෝලන්තයක් නොවන බව පසක් කරමින් සෞඛ්‍ය ඇමතිවරයා සැත්කම කල වෛද්‍යවරුන්ට දඬුවම් දෙන බවට මාධ්‍ය වලට වහසි බස් දොඩයි. මාධ්‍යකරුවෝ ශෝකයෙන් කම්පිත රෝගියාගේ පියා උසිගන්වා වෛද්‍යවරුන් රෝගියා මැරූ ආකාරයට ප්‍රකාශ ගෙන ප්‍රධාන පුවත් විකාශයන් වල තලුමරමින් පලකරති.

මේ වන විට දූපත පුරා සිටි හෘද ශල්‍යවෛද්‍යවරුන් වඳවී ගොසිනි. වෛද්‍යවරුන්ට බලපෑම් කර සෞඛ්‍ය ඇමතිවරයාටද දැන් ඒවා මතක නැත.

අවසන දූපත්වාසීන් ලංකාවේ මුල්ම හෘද බද්ධ කිරීම කල වෛද්‍යවරුන්ට දඬුවම් කිරීමට පිලිවෙතින් පෙලගැසී සිටිති.

ඔව්, මේ වෛද්‍යවරු වැරැද්දක් කලහ. ඒ මේ දූපත පෝලන්තය යැයි සිතීමය. මේ ඡායාරූපයට ලෝකයෙන් ලැබුනු ආචාරය ඔවුන්ටද මේ දූපතේදී ලැබේ යැයි සිතීමය.

ඒ වරදට ඔවුන් වන්දි ගෙවනු ඇත.

මේ දූපතේ නැවතත් හෘද බද්ධ කිරීම් වේ යැයි මට සිතෙන්නේ නැත.

මේ පෝලන්තය නොවේ....

**සන්නස වෙළඳ දැන්වීම්**
Sannasa Advrertising

**එස් ජයසිංහ / S Jayasinghe**
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

**අසෝක සුබසිංහ / Asoka Subasinghe** 0432 391 922
email - sannasanews@gmail.com